හින්දී කිවියර සුධීර් සක්සේනාගේ කාව්‍ය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ආර්. එම්. පී. සුභාෂිණී මැණිකේ රත්නායක

Abstract

The modern era of Hindi literature is distinguished by several aspects. This paper discusses the progressive consciousness in the poetry literature of modern Hindi poet Sudheer Saxena. For this purpose, I selected a collection of poems of Sudhir Saxena. That is '111 kavitaen'. It is important to note that after independence, many traits of literary movements are observed in Hindi literature. One of the important trait is progressive movement and ideology in literary. Sudhir Saxena has influence of progressive movement and modernism in his writing. This research focuses on how Sudheer Saxena views new emerging social and political conditions and the specificities in the context of progression. Sudheer Saxena's '111 kavitaen' is taken as the key central text and aspects of progressiveness is an international character attempted to show society free from exploitation by the capitalist system. This paper attempts to examine the positive impact of the poetry of Sudheer Saxena on modern Hindi verse literature.

Key-words: Modernism, Progressive movement, Modern Hindi verse literature, Sudheer Saxena, Culture society

ප්‍රමුඛ පදඃ නූතනවාදය, ප්‍රගතිශීලී ව්‍යාපාරය, නූතන හින්දි පද්‍ය සාහිත්‍යය, සුධීර් සක්සේනා, සංස්කෘතික සමාජය

හැඳින්වීම

නිදහසින් පසු හින්දි සාහිත්‍යයේ විද්‍යමාන වන වඩාත් බලපෑම් සහගත සාහිත්‍ය ධාරාව ලෙස 'නයී කවිතා' නොහොත් නව කවි ව්‍යාපාරය ඇසුරින් හින්දි සාහිත්‍යයේ නූතන යුගයේ විශිෂ්ටත්වය පැති කිහිපයක් පාදක කරගනිමින් නිරීක්ෂණය කළ හැකි ය. නයී කවිතා සාහිත්‍ය ව්‍යාපාරය හින්දි සාහිත්‍යයේ නූතන යුගය තුළ සීමා රහිත කාර්යභාරයක් ඉටු කරන සාහිත්‍ය ව්‍යාපාරයක් ලෙස හඳුනා ගනු ලැබුණි. නූතන හින්දි සාහිත්‍යයේ නිර්මාණවේදීන් අතර සුධීර් සක්සේනා වනාහි සුවිශේෂ වන්නෙකි. පශ්චාත් නූතනවාදයේ විවිධ දෘෂ්ටිවාද, න්‍යාය සහ දේශ දේශාන්තරහි සංචාරයෙන් ලත් සංස්කෘතික ඥානයෙන් පෝෂණය වූ සුධීර් සක්සේනා සතු ප්‍රතිභාන්විත කවීත්වය ජගත් සම්භාවනාවට පාත්‍රවන්නේ ය. පුෂ්කින් සම්මානය ඇතුළු සම්මාන ගණනකින් නූතන හින්දි සාහිත්‍යය කරා විශ්ව කීර්තියක් අත්කර දීමෙහි ලා සමත් සාහිත්‍යවේදියෙකු ලෙස සුධීර් සක්සේනා ප්‍රමුඛ වන්නේ ය. සුධීර් සක්සේනා විසින් විරචිත කාව්‍ය නිර්මාණ නූතන හින්දි සාහිත්‍යයට නව විචාර ප්‍රවේශයක් අත්කර දෙන ලදි. හින්දි සාහිත්‍යයේ නූතන යුගයේ 'නයී කවිතා' නැමැති සාහිත්‍ය ව්‍යාපාරය ගවේෂණයට ලක් කිරීමේ දී සුධීර් සක්සේනා කාව්‍ය නිර්මාණ අධ්‍යයන ක්ෂේත්‍රයක් ලෙස ද හඳුනා ගත හැකි ය.

හින්දි බසින් නිර්මාණකරණයේ යෙදෙන ආචාර්ය සුධීර් සක්සේනා, සුවිශේෂ ප්‍රතිභාවක්, ඇති පූර්ණ කලාකරුවකු අත්පත් කර ගන්නා බුද්ධිමය එලදාවකින් යුතු ඉන්ද්‍රියානු නිර්මාණකරුවෙකි. සුධීර්, සක්සේනා සීමා මායිම්වලින් මැනිය හැකි කලාකරුවකු නො වේ. ඔහු ලේඛකයෙකි; පුවත්පත් කලාවේදියකි; පරිවර්තකයෙකි; කවියෙකි; සඟරා සංස්කාරකවරයෙකි; ආචාර්ය උපාධිධරයෙකි. ඒ අතරින් ඔහු වඩාත් කැපී පෙනෙන්නේ කවියකු ලෙස ය. උස්බැකිස්ථානය, අර්මේනියාව, ජර්මනිය, සෝවියට් රුසියාව, චීනය, ජපානය, මැලේසියාව, තායිලන්තය, දකුණු අප්‍රිකාව, ඉතියෝපියාව, ඊශ්‍රාලය, තුර්කිය, නේපාලය හා ශ්‍රී ලංකාව යන රටවල යාත්‍රා කරමින් ඔහුගේ හෘදය විසින් සාධාරණීයකරණය කරන ලද අනුභූතින් ඔස්සේ ඔහු තම නිර්මාණ කාර්යයේ බහුශ්‍රැතභාවය ගෙනහැර පාන කවියා පාඨකයාගේ ඥාන මණ්ඩලය පුළුල් කරයි. දෙස් විදෙස් සම්මානවලට පාත්‍ර වූ සුධීර්, රුසියානු කවියන් හින්දියට හඳුන්වාදීම වෙනුවෙන් 'පුෂ්කින්'' සම්මානය ද දිනාගත්තේ ය.

පර්යේෂණ අරමුණ

ශ්‍රී ලාංකීය ශාස්ත්‍රීය ලෝකය තුළ වැඩි වශයෙන් අප්‍රකට ව පවත්නා වූ නූතන හින්දි කවිය පිළිබඳ උනන්දුවක් ඇති කෙරෙන සේ සූධීර් සක්සේනාගේ කවියේ වැදගත්කම පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම මෙම අධ්‍යයනයෙහි අරමුණ යි.

පර්යේෂණ ගැටලුව

නූතන හින්දි කවිය පෝෂණය කිරීමට සුධීර් සක්සේනාගේ කවිය භාවමය සහ ආකෘතිමය වශයෙන් බලපා ඇති ද? නැති ද? යන්න පර්යේෂණයෙහි ගැටලුව යි.

පර්යේෂණ ක්‍රමවේදය

ගුණාත්මක පර්යේෂණයක් ලෙස සිදුකරන ලද මෙම පර්යේෂණයේ දී ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍ර ඇසුරින් දත්ත රැස්කරන ලදි. ප්‍රාථමික මූලාශ්‍ර වශයෙන් සුධීර් සක්සේනා විසින් රචිත කාව්‍ය කෘති හතක් ද, ද්විතීක මූලාශ්‍ර වශයෙන් ඒවා පිළිබඳ සම සහ පශ්චාත් කාලීනයන්ගේ මත ද අධ්‍යනය කෙරේ.

හින්දි කිවියර සුධීර් සක්සේනාගේ කාව්‍ය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

බෙංගාලි, මරාඨී, පංජාබි, ඇසෑම්, ගුජරාතී වැනි ඉන්දියානු භාෂාවලටත් රුසියානු, ඉංග්‍රීසි, නේපාලී සහ සිංහල වැනි විදේශ භාෂාවලටත් පරිවර්තනය වී ඇති ඔහුගේ කවිය සියුම් ප්‍රභේද සමඟ අතිශය පුළුල් විශ්වීය පරිසරයක් ගොනු කරගන්නා වූ කාව්‍යමය කථනයකි. කවියකු ලෙස සුධීර් සක්සේනා සතුව ඇත්තේ තමන්ට ම උරුම ශෛලියකි. ගැඹුරු කාව්‍යරූපී අන්තර්ඥානයකි. පුළුල් දර්ශනයක් සහිත වු සංවේදිතා රාශියකි. ඔහු තම කවියේ කේන්ද්‍රය බහුවිධ මිනිසත්කමේ වටිනාකම බවට පත්කර ගත් අතර ප්‍රේමයත්, ශෘංගාරයත්, ජීවිතයේ යථාර්ථයත් කවියට මුසු කරමින් නූතන හින්දී කවියට සිදුකරන බලපෑම විශද ය. එසේ ම ඔහුගේ කාව්‍ය නිර්මාණවලින් අංකුර නිර්මාණකරුවෝ ස්වකීය නිර්මාණ සඳහා

නිර්මාණාවේශය ලැබුවෝ ය.

ජීවිතයේ ඉතා කුඩා නිමේෂයන්හි සිට ඉතිහාසයේ අනුස්මරණීය සියවස්වල සජීවී රූප රාමු ඔහුගේ කවිය ඔස්සේ පුනර්ජීවනයක් ලබන බව කිව හැකි ය. සුධීර් සක්සේනාගේ කවියෙන් ගම්‍ය වන්නේ නූතන හින්දි කවියන් අතර නූතන කවියට අදාළ අතිශය පුළුල් පරාමිති වන බව අපට හඳුනා ගත හැකි ය. ජීවිතය පිළිබඳ කිසිදා සංතෘප්ත නො වන ආශාවාදී දෘෂ්ටිය, ඔහුගේ කවියේ ආලෝක වූ බව ඔහු විසින් විරචිත කාව්‍ය කෘතිවලින් පළ කරන සුවිශේෂ ලකුණකි. පරිභෝජනවාදය සහ වෙළඳපොළ නාභිගත කරගත් පශ්චාද් නූතනවාදී දෘෂ්ටිවාදයේ දී පවා සුධීර් සක්සේනාගේ කවිය වඩා ප්‍රාසාංගික අත්දැකීමක් ලෙස පාඨකයාට විඳ ගැනීමට හැකි වීම සුධීර් සක්සේනාගේ කාව්‍යකරණයේ විශේෂත්ව ය යි. විටෙක ඔහුගේ පෑන, රමණීය භාෂා ප්‍රයෝග භාවිතයෙන් සාරවත් වූ හැඟීම් සමුදායක් නිර්මාණය කරන අතර තවත් විටෙක මානවීයත්වයේ සංවාහකයෙකු ලෙස ධනේශ්වර සාහසිකත්වයට එරෙහි ව ගිනිපුහුරු උපදවන ආකාරයත් අපට හඳුනා ගැනීමට දුෂ්කර නො වන්නේ ය. සුධීර් සක්සේනා යනු, සියලු සාහිත්‍යාංග අතුරින් කවියට සැලකිය යුතු ඉඩක් හිමි නො වන යුගයක පවා කවිය ප්‍රබල අවියක් ලෙස විශ්වාස කරන නිර්මාණකරුවෙකි. ඔහුගේ කාව්‍ය විසින් නැවත නැවතත් අවධාරණය කරනු ලබන්නේ පශ්චාත් නූතනවාදයේත්, ඉන් පසුවත් කවිය ගැන විශ්වාසය තබාගත යුතු බව ය. සියල්ල අවසන් වූ පසුවත් ශේෂවන යමක් කෙරෙහි කවියා බලාපොරොත්තු දල්වා ගනියි. ඒ කවිය පිළිබඳ ව යි. ඔහු ලියයි,

''...කිසිවක නැත නිමක්

නිමක් නැත කිසිවක්

මොහොතක් ගෙවී ගිය පසුවත්

උදාවෙයි නව මොහොතක්

පැතුමකට පසුවත්

උදාවෙයි තව පැතුමක්

ඇත ලොවේ හෙටටත් ඉඩක්

තව අලුත් දෙයකට

ශබ්ද කෝෂයක හිඩැසක්

තිබෙනු ඇත තව වදනකට

කවි ලොවෙහි සදහට ම

ඇත ඉඩක් නව කවියකට"

මහාචාර්ය දර්ශන රත්නායකයන් විසින් කවිය සහ කවියා පිළිබඳ ව ඉදිරිපත් කරන ලද අදහස මෙහි සඳහන් කිරීම අනුචිත නො වේ. "කවිය කාව්‍යමය පරිකල්පනය ප්‍රතිෂ්ඨාව කරගත් භාවයේත් බුද්ධියේත් සංකලනයෙන් බිහි වන අපූර්ව වූත් භාෂාමය වූත් මානව නිර්මිතයකි. මානව නිර්මාණයක් වූ කවිය පරිකල්පනයේ අග්‍ර ඵලයකි. සිතීමේ දැනීමේ විඳීමේ පමණක් නොව දැකීමේ ඇසීමේ සහ අවබෝධ කර ගැනීමේ ශක්‍යතාවය ද මිනිසාගෙන් මිනිසාට විචිත්‍ර වේ. කවිය බිහි කරන ප්‍රමුඛත ම ශක්‍යතාවය වන ප්‍රතිභාව පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ." ඒ අනුව ප්‍රතිභාව සහ සතතාභ්‍යාසයෙන් සුපෝෂිත කවියෙක් ලෙස සුධීර් සක්සේනා හඳුනා ගතහැකි ය.

මහාචාර්ය දර්ශන රත්නායකයෝ තවදුරටත් මෙසේ පවසති. "...ප්‍රතිභාව සෑම කවියෙකුට ම පොදු වූ සාධනාවකි. ඒ නිසා කවියා යනු සංවේදී ප්‍රතිභාන්විත කලාකරුවෙකි. ඔහු ස්වකීය නිර්මාණ මාධ්‍යය වන පද සංගති උපයෝගී කර ගනිමින් ස්වකීය වේදිතයන් අපූර්ව ආකාරයෙන් සහෘදයන්ට ආසාදනය කරවන්නෙකි. එබැවින් පෙරදිග පඬිවරුන් ප්‍රතිභාව නිර්වචනය කොට ඇත්තේ අපූර්ව වස්තු නිර්මාණයන්හි සමත් ප්‍රඥාව ප්‍රතිභාව නම් වේ. විශේෂයෙන් රස ආවේශ කරන ලද නිර්මල සෞන්දර්ය කාව්‍ය නිර්මාණයෙහි ශූර භාවය යි. යනුවෙනි. එම ප්‍රතිභාව නිසර්ගයෙන් හෙවත් සහජයෙන් බහුශ්‍රැතභාවයෙන් හා සතතාභ්‍යාසයෙන් පහළ වේ..." සුධීර් සක්සේනා නම් නූතන හින්දි කවියාගෙන් වඩාත් පිළිබිඹු වන්නේ එම සහජ ප්‍රතිභාව යි.

වඩාත් යහපත් සමාජයක නිර්මාණය උදෙසා සිදු කරන අරගලය ජීවිතයේ අනිවාර්ය අංගයක් වන බව කවියා සිය ජීවිතයෙන් ම අත්දැක්කේ ය. දිවිසැරිය තුළ බිම වැටෙමින්, නැගිටිමින් මානවයෙකු ලෙස ඔහු සිදු කළ යාත්‍රාව ඔහුගේ කවියට ලැබුණු විශාල ම උත්තේජනයක් බව කවියා ම සඳහන් කරන්නේ ය. කෙතරම් දුෂ්කර වුව ද, නැවුම් බව අත්පත් කර ගැනීම සුධීර් සක්සේනා නම් කවියා විසින් අත් නො හරින ලදී. ඒ නැවුම් බව ඔහුගේ කවිය පුරා විහිදී යන අනන්‍යතාවක් ලෙස විද්‍යමාන විය. සුධීර්ගේ කවියේ මෙම සිත්ගත් සෞන්දර්යමය ගුණාංගය කෙරෙහි සවිඥානික වන සහෘදයා භූගෝලීය සාධක, ජාතිකත්වය සහ සංස්කෘතිය මූලික කර ගත් ස්වලක්ෂණ ද අතික්‍රමණය කර සුධීර් සක්සේනාගේ පද්‍ය නිර්මාණවලට ආශක්ත වන්නේ එකී අනන්‍යතාවය හේතුවෙනි. දශක පහක් වැනි දීර්ඝ කාලයක සිට පාඨකයා සමඟ බෙදා ගන්නා ඔහුගේ කවිය විසින් ම සුධීර් සක්සේනා කවියකු ලෙස හැඟීමේ පරමාර්ථය පෙන්වා දෙන්නේ ය.

කාව්‍යකරණයට පිවිසීම සඳහා සුධීර් සක්සේනා සාමාන්‍ය යෞවනයා ව පොළඹවනු ලබන්නේ ඔහුගේ පවුල් පරිසරය විසිනි. ඔහුගේ පියාත්, සුළු පියාත් හින්දි කවියෝ වූ හ. කිවිඳියක නො වුණත් ඔහුගේ මව හින්දි භාෂාව පිළිබඳ පුළුල් අවබෝධයක් සහිත ව පොත-පත ඇසුරු කළ කාන්තාවකි. සාහිත්‍යය ඇසුරේ හැදුණු වැඩුණු සුධීර් අවුරුදු දොළහ වන විට ම කවි ලිවීම ආරම්භ කරන්නේ ය. සමාජය සමඟ තමා තුළ බිහි වන කවියා මනා ලෙස ඔප මට්ටම් කර ගැනීමට ඔහුට හැකි විය. විශ්වවිද්‍යාල ශිෂ්‍යයකු, උපාධිධරයකු, පර්යේෂකයකු ලෙස සමාජ-දේශපාලන ක්‍රියාකාරකම් රැසකට දායක වෙමින්, ඔහු සිය අත්දැකීම්වල සීමාවත්, ඥාන සම්භාරයත් ව්‍යාප්ත කරගන්නේ ය. එවකට ඉන්දියාවේ ක්‍රියාත්මක වූ සමාජවාදී ව්‍යාපාරය, ප්‍රගතිශීලී සාහිත්‍යය ව්‍යාපාර වැනි බලවේගවල ඔහු සක්‍රීය සාමාජිකයෙකු බවට පත්වෙන්නේ සාහිත්‍ය නිමාණකරුවෙකුට යුගයේ අවශ්‍යතාවන්ට පිටුපා නොහැකි බව සනාථ කරමිනි. ඉන්දිරා ගාන්ධි පාලන සමය තුළ ඇති වූ දේශපාලන සංකීර්ණතා ඔස්සේ සමාජය තුළ බිහි වූ විරෝධතා ව්‍යාපාරයට අප කවියා සම්බන්ධ වුයේ ය. ජීවිතය, අවිච්ඡින්න සංකීර්ණතා දෙසට ඇදෙන විට 'කවිය, සුධීර් සක්සේනාගේ ආත්මීය ප්‍රකාශනය බවට පත්වන්නේ ය. ඒ පිළිබඳ

සුධීර් මෙසේ පවස යි. ''...යම්කිසි භාෂාවක් ඔස්සේ හැඟීමක් හෝ අදහසක් සංක්ෂිප්ත ව සහ කලාත්මක ඉදිරිපත් කිරීමයි මා කවිය ලෙස දකින්නේ. හැඟීම් සඟවාගෙන සිටීමට හෝ අමතක කිරීමට මට හැකියාවක් නැහැ. නොකඩවා මම කවි ලියන්නේ ඒ නිසා...''

1975 දී පුවත්පත් කලාවට සම්බන්ධවීමත් සමඟ සිය චින්තනය සහ දැක්ම විමසුමට ලක් කිරීමට සුවිශේෂ මාධ්‍යයක් ඔහුට හමුවෙයි. උපන් භූමිය වන ලබ්නව් නගරයෙන් නික්මෙන අප කවියාගේ පියවර මුළු මහත් ඉන්දියානු අර්ධද්වීපයේත් බොහෝ විදෙස් රටවලත් දූවිල්ල ස්පර්ශ කරන්නේ ය. සිය භාවාත්මක සන්නිවේදන ක්‍රමය වඩාත් පොහොසත් කිරීමට අවැසි කවි නිමිති රැසක් සොයාගන්නට එහි දී කවියා සමත් වන්නේ ය. එහි ප්‍රතිඵලය වන්නේ සුධීර් සක්සේනා නම් මිනිසා තුළ ජීවත් වන පුවත්පත් කලාවේදියාට වඩා කවියා, බහුශ්‍රැතභාවය අභිභවමින් අව්‍යාජ ලෙස බිහිවීම යි. ජීවන අත්දැකීම්වල බාහුල්‍ය පෙරා වෙන්කර අව්‍යාජව කවිය තුළින් විදාරණය කිරීමට ඔහු දක්වන ප්‍රතිභාව ප්‍රශංසනීය වේ. අතොරක් නැති ස්වභාවදහමේ සෞන්දර්ය සොයමින්, ලොව පුරා මිනිසුන් මුණගැසෙමින්, ඒ මිනිසුන්ගේ ඉතිහාසය සොයමින් කවියා විසින් සිදු කරන ලද යාත්‍රා පාඨකයාට අමතක නොවන සමීප අත්දැකීමක් බවට පරිවර්තනය කිරීමට ඔහුගේ කවීත්වයට හැකි විය.

''අනුවණ මිනිසුන් විසින් මනුෂ්‍යයා යැයි අමතන දෙවියන්ට මම සේවය කරමි.'' ඉන්දියානු දාර්ශනිකයකු වූ ස්වාමි විවේකානන්ද විසින් සඳහන් කරන ලද ඉහත කියමන ජීවිතයේ ආදර්ශ පාඨය කර ගන්නා පරිණත ප්‍රශස්ත කවියා මානවීය වටිනාකම ස්ථාපිත කිරීමේ අරමුණින් තම කවියට ජීවය දෙන්නේ ය. ඔහුගේ කවිවල ගැබ් වී ඇති ලෝකාවබෝධය, පරිකල්පන ශක්තිය ඉහළ ය. සුධීර් සක්සේනාගේ කාව්‍ය නිර්මාණවල කාව්‍ය සංකල්ප ආකෘතිය භාෂාව මනෝභාව අව්‍යාජ ලෙස මෙන් ම මනා සංයමයකින් සංයෝජනය වී තිබේ. උසස් කාව්‍ය නිර්මාණවලට පොදු ලක්ෂණ ලෙස විචාරක අවධානයට පාත්‍ර වූ ස්වකීය ජීවන පරිසරය හා අනුබද්ධ කාව්‍යානුභූති භාවිතය, සංකේත කථනය, වක්‍ර භාෂණය, අව්‍යාජත්වය, සංයමය, වින්දනය සහ ඥානය වැනි අංග සුධීර්ගේ කාව්‍යයේ පරිපූර්ණ ලෙස අන්තර්ගතය. ඔහුගේ සෑම කවියක ම එහි ම වූ විචාර අවකාශයක් ගැබ් වී ඇත්තේ

ඒ හේතුවෙනි. පාඨකයාගේ මනෝභාවයත්, දැක්මත් සුධීර්ගේ, කවිය වැළඳ ගැනීමටත්, ප්‍රතික්ෂේප කිරීමටත් තීව්‍ර නිර්ණායකයක් වන්නේ ද එබැවිනි.

සුධීර්ගේ කවියේ අක්මුල් ශක්තිමත් වී ඇත්තේ මාක්ස්වාදය නමැති භාෂාණයෙන් බව ඔහුගේ කවිය විමසීමේ දී හමුවන සුවිශේෂ කරුණකි. එබැවින් රතුපාටට, කවියා වඩාත් ප්‍රිය කරන්නේ ය. කවියා එම සංඥාව භාවිතා කොට ඇත්තේ පංති රහිත සමාජ නිර්මාණයක් වෙනුවෙන් සිදු කරන විප්ලවයට බව පැහැදිලි ය. රතු පාටට කැමති පිරිස සමඟ කවියා අත්වැල් බැඳගන්නේ ය. ධනවාදය පාදඩකරණයට ලක් වූ යුගයක දී පවා 'රතුපාට' තවමත් බලවත් බව කවියාගේ විශ්වාස ය යි. මෙම විෂයානුබද්ධ වපසරිය සිය කාව්‍යානුභූතියෙන් ආවරණය කිරීමට, සුධීර් විසින් ගන්නා ලද විශිෂ්ට ප්‍රවේශයකිග 'තවමත් රතුපාටයි නැගෙනහිර' කවි පන්තිය.

"...මන්ද තවමත් රතුපාටයි

නැගෙනහිර

තවමත් රතුපාටයි

හිරුගේ මුවමඬල

තවමත් රතුපාටයි

මිනිස් සිරුරේ රුධිරය

එපමණක් නොව

රතුම රතුපාටයි

මේ දැන් උපන් බිළිඳකගේ

මුවකමල"

මෙම පද්‍යයෙන් ගම්‍ය වන්නේ නව ලොවක් බිහිකිරීම සඳහා සිදු කෙරෙන පංති අරගලය විශ්වාස කරන පරම්පරාවක් ලෝකය තුළ පහළ වන බව ය. මෙයින් පෙනී යන්නේ කවියාගේ ඥාන සම්භාරය,

ප්‍රතිභාව සහ ජීවන අත්දැකීම් විවිධාකාරයෙන් සංස්කරණය වී නිර්මාණ බිහිවන ආකාරය යි.

අධිරාජ්‍යවාදීන් විසින් නිර්මාණය කරන ලද පීඩිත පංතියේ භූ කලාපය ඉතා විශාල ය. ධනේශ්වරයේ ගොරහැඩි බවින් මිරිකෙන එහි ජීවිතය සංකීර්ණ ය. වේදනාව ගැඹුරු ය. 'ඇමරිකාව' ලෙසට අලුත් මුහුණකින් ක්‍රියාත්මක වන ධනේශ්වර සාහසිකත්වය හෙළිකිරීමට කවියා පසුබට නො වන්නේ ය.

'අ' යන්නෙන්

අඹ නොවෙයි

අම්මා නොවෙයි

අන්නාසි ද නොවෙයි

'අ' යන්නෙන්

අමරිකාවයි

'බ' යන්නෙන්

බල්ලා නොවෙයි

බස්තම නොවෙයි

බස්සා නොවෙයි

බුශ්ය

ලොව පුරා එක් එක් බසට

අයත් හෝඩි පොත්වලට

සිදුවේවි කියාදෙන්නට

අද රැයේ සිට

'අ' යන්නෙන් ඇමරිකාව

'බ' යන්නෙන් බුශ්

අතර

පණ රැඳී ඇති වග"...

නූතන අධිරාජ්‍යවාදය ලෙසින් ලෝකය සිය ග්‍රහණයට නතු කරගැනීමට අභ්‍යන්තරයෙන් යක්ෂයෙකු ලෙස ද මතුපිටින් සාන්තවරයෙකු ලෙස ද පෙනී සිටින ඇමරිකානු ඊනියා සුචරිතවාදයේ සටකපටිභාවයේ නිරුවත මෙම කවියෙහි රැඳී ඇත්තේ ය. මෙහි එන 'අඹ නොවෙයි', 'අම්මා නොවෙයි', 'අන්නාසි නොවෙයි', යන පද කාව්‍යයෙහි විෂය ස්වරූපයත්, සමස්ත සිද්ධියත් ධ්වනිත කිරීමට සමත් කාව්‍ය යෙදුම් ය.

ඍජු වදන් පෙළ ගැස්මට පසුපසින් අති විශාල අර්ථ සමුදායක් මෙන් ම වක්‍ර භාෂණ භාවිතාව සම්පූර්ණ කාව්‍ය නිර්මාණයෙන් ප්‍රබල ව පිළිබිඹු වන්නේ ය. ලෝකය වඩා යහපත් තැනක් බවට පත්කිරීමට සිහින දකින අප කවියාගේ ගමන් සඟයා ද, හබල ද, ආයුධය ද වන්නේ කවිය යි. මානවීයත්වයට එරෙහි වන සියලු ම ප්‍රපංච කෙරෙහි විරෝධයේ ස්වරය නැඟීමට ඔහුගේ කවිය අවියෝජනීය ලෙස ක්‍රියා කරන ආකාරය මෙම කවියෙන් ගම්‍ය වෙයි. සුධීර්ගේ කාව්‍ය නිර්මාණ පිළිබඳ විශිෂ්ට හින්දි කවියකු වන ඕම් භාරතීගේ පහත සටහන මෙහි සටන් කිරීම අනුචිත නො වේ යැයි සිතමි.

''සුධීර්ගේ කවිය ඉතිහාසය නැමති ස්ප්‍රිං මේට්ටයේ සිට නිවරදි ඉලක්කය ගෙන 'අද දවස' නැමති පොළවට ඍජු ව පිම්මක් පනියි. ඉන්පසු වර්තමානයේ යථාර්ථය පිටතට රැගෙන එයි. සිය නිර්මාණ තුළ කාලයේ යථාර්ථය ජීවත් කළ හැකි කවියන් සිටින්නේ කීයෙන් කී දෙනා ද? එවැනි නිර්මාණකරුවන්ගේ වියමන් තුළ ශක්තිමත් නූලක් බවට පත්වන කාලය අනර්ඝ වස්ත්‍රයක් පිළියෙල කරයි.''

ඒකාධිපතිවාදය නැවත නැවතත් ජීවත් කරවන ධනේශ්වර ආධිපත්‍යයය, නව මානව පරම්පරාවක් ඉදිරියේ දී ආක්‍රමණය වන

බව කවියාගේ දැඩි විශ්වාසය වේ. සුධීර් සක්සේනා එම නව පරපුර කෙරෙහි බලාපොරොත්තු දල්වා ගන්නේ කාව්‍ය නිර්මාණයකින් සමාජයට සිදුවන ප්‍රයෝජනය සහෘදයන් වෙතට සමීප කරවමිනි. සාහිත්‍ය නිර්මාපකයෙකු විසින් සහෘදයන් ඥානාන්විතභාවයට පත්කරන්නේ කෙසේ ද? යන්න මෙම කවියෙන් ඇඟවී ය යි. 'හිට්ලර්ගේ රැවුල' සුධීර් සක්සේනාගේ බහුලව ම සාකච්ඡාවට ලක් වූ කාව්‍ය නිර්මාණ අතරින් එකකි. ඒ ඔස්සේ කවියා දල්වා ගන්නේ ඉහත කී බලාපොරොත්තුව යි.

"...හිට්ලර් කුඩා දරුවෙක් සමඟ

දරුවා

සෙල්ලමක දඟම දඟ

හිට්ලර්ගේ රැවුලත් සමඟ

ඔව්!

ඒ මිනීමරු

හිට්ලර්ය

ඒකාධිපති

හිට්ලර්ය

පණපිටින් මිනිසුන්ව පිළිස්සූ

ගෑස් කුටිවල දමා හිර කෙරූ..."

සුධීර් සක්සේනා අබ්බාර්ග පාච් කවිතාඒ, බස්තර්, ධූසර් මේ බිලාසාපූර් වැනි දීර්ඝකාව්‍ය නිර්මාණ ඔස්සේ මිනිස් ජීවිතය ඉදිරියේ ඇති විවිධ සංකීර්ණතා දේශපාලනික ව විග්‍රහ කිරීමට දරා ඇති සාර්ථක උත්සාහය ඔහුගේ කවිය පිරික්සීමෙ දී හඳුනාගත හැකි ය. අතිශය ගැඹුරු, තේමාවල සිට ඉතා සරල තේමා දක්වා පැතිරුණ විවිධත්වයක් සුධීර්ගේ කවියට හිමි ය. වියත් කවියෙකුගේ වුව ද සියත්

බව වඩාත් මතු වන්නේ ඔහු සිය පියවි දිවියට සමීප වන විට බව මහාචාර්ය දර්ශන රත්නායකයන් සියත් කවි සරණිය සංසන්දනාත්මක විවරණය නම් තම ශාස්ත්‍රීය ලිපියෙහි පැහැදිලි කරයි. නිදසුනක් ලෙස සුධීර් සක්සේනාගේ 'සමෝසා' නම් කවි පංතියෙන් ඉන්දියානුවන්ට අතිශය සමීප සමෝසා නම් භෝජනයේ වැදගත්කම ප්‍රණීත බව කුසගිනි නිවීමේ ශක්‍යතාවය ද නිරූපණය කර ඇත්තේ මෙසේ ය.

"සමෝසා

අපේම කෑමකි

අති මිහිරැති

නටන උණු තෙල්වල

යුග ගණන් බැදි බැදී

කොහොම කෑවත්

සමෝසා

දිව්‍යම අහරකි

සමෝසා කන සෑමවිටක ම

නැඟෙයි මගේ මතකයට

ලීලාධාර් මංඩලෝකීගේ කවියක්

'සමෝසා කුසගිනි නිවීමේ කලාවක්"

ඉන්දියාවේ අතිශය සුලභ ආහාරයක් වන 'සමෝසා' කවියාගෙන් ගිලිහී නො ය යි. කෙතරම් සරල තේමාවක් වුව ද එය සුධීර් විසින් ජීවිතයට බද්ධ කරනු ලබන්නේ විශද වූ දාර්ශනිකත්වයකිනි.

පුවත්පත් කලාවේදියකු ලෙස සුධීර් සක්සේනා ලබන අත්දැකීම්වල සහ විමසීමට ලක්කරන ලෝක පුවත්වල වාසිය තම කාව්‍ය නිර්මාණ වෙත පවරා ගන්නා සුධීර් සක්සේනා තමා තුළ

වෙසෙන කවියා ව වසාගන්නට පුවත්පත් කලාවේදියාට ඉඩ නො දෙයි. එම නිසා ඔහුගේ කවිය හෙළිදරව්වකින් ඔබ්බට ගොස් ජීවිතයත්, ජීවිතයේ අපේක්ෂාවනුත් සමඟ සංකලනය වූ කලාත්මක මාවතකට පිවිසීම අනිවාර්ය වී ඇත. එබැවින් සහෘදයාට ඔහුගේ කාව්‍යයන්හි සියුම් අවස්ථා හා සමවැදී කවියාගේ හෘදය සමග සංවාසයේ යෙදීමට මහගු අවස්ථාවක් උදාවෙයි. ඉහත කවියෙන් මේ කරුණ සමර්ථනය වෙයි.

නිර්මාණකරුවාගේ ජීවන විලාසය කෘත්‍රිම නො වන තරමට ඔහුගේ නිර්මාණකාර්ය ද ස්වභාවිකත්වයෙන් පිරී යන්නේ ය. සුධීර්ගේ කවිය සහෘදයාට අනුගත වෙන්නේ මෙපරිද්දෙනි. කවියාගේ කාව්‍ය නිර්මාණවල නිරූපිත යථාර්ථය මඟින් පාඨකයාව ග්‍රහණයට හසුකරග නු ලැබීම මවිතයට කරුණක් නො වේ. ඇතැම් ලේඛකයන්ගේ නිර්මාණ ඔස්සේ අපට හමුවන කෘත්‍රිම බව සහ අතිශයෝක්තිය සුධීර්ගේ කවියෙන් අතුරුදහන් වී සිත් කාවදින විශද ස්වරූපයෙන් එම කවි සහෘදයාට දැනුම සපය යි. ගැස්මකින් හෝ පැකිළීමකින් තොරව ස්වකීය වින්දනය කවිය තුළට බහාලීමට උත්සාහ දරන කවියා මිනිස් සමාජයේ අතීතය අනාගතය දෙසට ආලෝකධාරා විහිදුව යි. සහෘදයාගේ ඥානමණ්ඩලය පුළුල් කරයි.

ලොව වටා සැරිසරන කවියා පාඨකයාට හුරු පුරුදු තැන්, මුහුණු සහ සංසිද්ධි සමඟ පාඨකයාව මුහු කරන අතර විටෙක පාඨකයාට කිසි ලෙසකවත් සමීප නො වන නැවුම් අත්දැකීම් විඳගන්නට ඔහුට අවකාශය සලස්වන්නේ ය. බුදුන්, ගාන්ධි, මැන්ඩලා, පුෂ්කින්, හිට්ලර් වැනි ඓතිහාසික මානව නිදසුන් කියවා ගනිමින් හෙතෙම දිල්ලිය, බරණැස, චිතගොන්, ලුම්බිණිය, මොස්කව්, බර්ලින්, ස්තාන්බුල්, ටෝකියෝ සහ ශ්‍රී ලංකාව තෙක් පාඨකයාව කැටුව යන්නේ ය. ඒ සෑම සැරිසැරීමක් මඟින් ම කවියා තමා යථා ලෝකයේ දී අත්දුටු සංසිද්ධි අතර සම්බන්ධතාවය විවිධ සංකල්ප රූප මඟින් සහෘදයාට සංස්පර්ෂ කරවීමට ප්‍රයත්න දරයි. ඔහුගේ කවි ඇසට ආවරණය වන්නේ අලුත් ම අලුත් රහස් ය. සුධීර් ඊයේ දිල්ලියේ නම් අද සිටින්නේ නේපාලයේ ය. හෙට බරණැස නම් අනිද්දා ලබ්නඋෆවල ය. මාසයකට පසුව වෙනත් දේශයක ය. ඔහු යාත්‍රා කළ සෑම ස්ථානයකට ම අයත් විශේෂ සුවඳක්, සුවිශේෂ ශෝභාවක්, මෙන් ම වේදනාවක් ඔහුගේ කවි ඇස ග්‍රහණය

කර ගන්නේ ය. ඉන්දියානු ආදිවාසින්, මාවෝවා දී සටන් සගයන් ජීවත් වන ඡත්තීස්ගඩ් ප්‍රාන්තයේ 'බස්තර්' නම් කැලෑව කවියාගේ ජීවිතයට අතිශය සමීප ස්ථානයකි. සුධීර් සක්සේනා සිය ආචාර්ය උපාධියේ පර්යේෂණ මාතෘකාව තෝරා ගන්නේ ද ආදිවාසින් සම්බන්ධව ය. මිනිසුන් සහ තුරුලතා සමඟ එක ම විට සංවාදයේ යෙදිය හැකි ලොව එක ම ස්ථානය බස්තර් බව කවියාගේ විශ්වාසය වේ. පහත කවියෙන් ගම්‍ය වන්නේ එම විශ්වාස ය යි.

"...ආයෙමත් එනවානම්

සොඳුරුයි ද කොයිතරම්

සැඳෑවක් එතරම්

මනරම්

ආසයි මං

සරාගී බස්තර් හි

පහස යළි ලැබේනම්

ආසයි මං

ආයෙමත් තිබේනම්

අත්ල මත රා බඳුන්

බස්තර් හි ඉස්තරම්..."

බරණැස නම් කාව්‍ය පංතිය මගින් ආගම විසින් උල්ලංඝණය කරනු ලබන සැබෑ දාර්ශනික සත්තාව ප්‍රබල ලෙස නිරූපණය කිරීමට කවියා සමත් වෙයි. එමගින් කවියා සහෘදයාගේ ඥාන මණ්ඩලය පෘථුලත්වයට පත්කරයි. කවියා හුදෙක් හින්දු ආගම පිළිඹිඹු නො කරයි. ඒ වෙනුවට සංකල්ප රූපාත්මක ව ග්‍රහණය කළ බරණැසෙහි යථාර්ථය කලාත්මකව ප්‍රතිනිර්මාණය කරයි. කවියා සාහිත්‍ය නිර්මාණයේ කලාත්මක උත්කෘෂ්ටතාව කුසලතාවයෙන් යුතු ව ඉවහල් කොට ගනියි.

හින්දූන්ගේ ශුද්ධ වූ භූමිය බරණැස තවදුරටත් කවියාව වසඟයට පත් නො කරන්නේ ය. භක්තියේ නාමයෙන් වංචාව ඉහවහා ගිය බරණැස ප්‍රතිගාමිත්වයේ ගිලී ගොසින් ය. මන්ත්‍ර ජපකිරීම තුළ සැඟවී ඇති බරණැසෙහි ව්‍යාජත්වය කවියා හෙළි කරන්නේ ය.

"සියල්ල සපිරියි

බරණැස

එහෙත්

දුරට ම පෙනෙයි එහි

ප්‍රේමයේ හිඩැස...

...බරණැස ඉතිරිලා බණපොත්

බරවෙලා ඉන් පූජකයන්ගේ අත්

එහි කිසිවෙක් එනමුත්

නොදනියි කියවන්න

හෝඩි පොතවත්

නොදනිමි කවදා සිටද උමතුවෙන්

බරණැස වුණේ මෙතරම් සැදැහත්

සාධුවරුනි අනේ පිංවත්

කියනු මැන දැන්වත්

බරණැස සිට දුරද

මොක්පුරට කෙතරම්

කුමන මඟ යායුතු ද

ඉක්මනින් ළං වෙන්න නම්"

ස්වකීය ග්‍රාමය සහ වාසස්ථානය හා සමාන ඉන්දියාවේ අගනුවර දිල්ලිය කෙසේ නම් කවියාගෙන් ගිලිහී යා හැකි ද? ඉසුරුමත් දිල්ලිය වසාගෙන පැතිරෙන බුන්වත් වූ දිල්ලිය කවියා අප ඉදිරියේ රූපණය කරන්නේ මෙසේ ය. 'කවිය' කවියාගේ ආත්මීය සංවේදනයන්ගේ හා අනුභූතින්ගේ හුදු ප්‍රකාශනයක් නොවී ජීවිතය ඥානනය කරන අයුරු මෙම කවිය සනාථ කරයි.

"කෙතරම් ද

දිල්ලිය ඉසුරුමත්

එතරම්ම

දිල්ලිය බුන්වත්

...

යමුනාව කොහි දැයි සෙව්වත්

හමුනොවෙයි එය ගලනා තැනක්

පාළු මූසල සොහොන් කොත්

දිල්ලියට ම උරුම

මහා සම්පත්

ඊටත් වඩා වටිනා යමක්

තිබෙනවා දිල්ලියට ම අයත්

නපුංසකයන්ගේ රැගුම්

ඇයි ගණිකාවන්ගේ මඩම්?..."

ලෝකයේ සංචාරය කළ බොහෝ ස්ථාන අතරින් ශ්‍රී ලංකාව කවියාගේ ආකර්ෂණයට වඩාත් ම ලක් වූ ස්ථානයකි. දෙවරක් ලංකාවේ සංචාරය කළ සුධීර්, වරක් අඩ මසක් ශ්‍රී ලංකාවේ ජීවත්

වුණේ ය. ලංකාවේ හරිත වර්ණවත් පරිසර පද්ධතියට ලොබ බැඳි කවියා, දිවයින වටා ඇති සයුරේ නිල් දියෙන් මෝහනය වී ගිය ආකාරය පහත කවි පංති සමර්ථනය කරව යි.

''දසුනක විහිදුන සෞන්දර්යක් ද

සෞන්දර්යක විහිදුන දසුනක් ද

පැවසීම දුෂ්කරය

එතරම් මනහරය

බැලූ බැලූ අත සොඳුරුය''...

... ලංකාව නම් පිරිපුන් සයුරේ

මොහොතින් මොහොත

ලවණ කැළතේ

නිම් නැති අසිරියේ

නමයි ලංකාව

සුරම්‍ය ඒ දේශයේ...

සිගිරියේ විස්මිත ඓතිහාසික වටිනාකමට නිහඬ ව සවන් දුන් කවියා සිංහල සිනමාවේ හඬ පෞර්ෂය වූ ජෝතිපාලගේ මියුරු හඬට ප්‍රේම කළේ ය. ලා දුඹුරු වර්ණය ස්වලක්ෂණය වන ලංකාවේ යෞවනියන්ගේ ලාවණ්‍යය සමුදුරෙන් ලද වටිනා ත්‍යාගයක් බව කවියා පවසන්නේ විශේෂෝක්ති මූලයට තැන දෙමිනි. ශ්‍රී ලාංකිකයෙකුට සාමාන්‍ය අත්දැකීමක් වන සාදික්කා සුවඳ සහ පැණි වළලුවල රස කෙරෙහි කවියා තුළ වූ සංවේදිතා රාශිය එකම පද්‍ය නිර්මාණයක් තුළින් ඉස්මත්තට ගෙන එයි. ස්වභාව ධර්මය කෙරෙහි කවියා තුළ පැවති ආකර්ෂණය ඔහුගේ බොහෝ කාව්‍ය නිර්මාණයන්හි සෞන්දර්යවාදී දෘෂ්ටියක් ලෙස විද්‍යමාන වේ. ශ්‍රී ලංකාව ගැන මෙතෙක් කිසිවෙක් හෙළි නො කරන ලද පෙර නො වූ විරූ සුන්දර රහස් ඔහුගේ කවි ලොවට හෙළි කරන්නේ ය.

''ගගගගගඉතිහාසයේ

අඩි ශබ්දය ඇසෙයි

සීගිරි ගිරි හිසින්

හෙළයි සුසුමන්

අතීතය ගැඹුරින්''...

''ගගගමේ දූපතේ සිටියි

සුලෝචනියන්

සුභාෂිනියන්

බලන්න

ඔවුන්ගේ දිදුළන

සිරුැර මනහර

ඉන්

හමා එයි

සාදික්කා සුවඳ

ඔවුන්

සුදු නැත

කළුත් නැත

මට පෙනෙන විලසට

ඔවුන්ගේ පාට

දුඹුරුැය''...

ගංගාව, ස්ත්‍රිය කෙරෙහි අන් කාටත් වඩා මෝහනයට පත්වූවෝ කවියෝ ය. සුධීර්ගේ කවිය තුළ ස්ත්‍රියට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයක් බව සැලකිය හැකි ය. ස්ත්‍රියගේ සුවිශේෂ ගුණ රැසක් අලලා කවියා සිය නිර්මාණ ප්‍රතිභාව විහිදාල යි. ස්ත්‍රිය සතු කුදු මහත් සැම සුවිශේෂත්වයක් ම සූක්ෂම ව කවියට නැගීමට සුධීර් සමත් වන්නේ ය. ස්ත්‍රිය නිරූපණය කිරීමේ දී කවියාගේ නිර්මාණ ආභාසය හින්දියෙහි තරුණ කවියන් කිහිප දෙනෙකුට ම විෂය වී ඇති අන්දම විද්‍යමාන වේ. ගැහැනිය පිළිබඳ සිනමා සිත්තමකින්, නවකතාවකින්, පිළිබිඹු නො කරන වාග් සිතුවම් රැසක් මවමින් සුධීර්ගේ කවිය ගැහැනියට විවිධ අයුරින් ජීවය කවන්නේ ය.

සුධීර්ගේ කවිය තුළ හමුවන ප්‍රේමය, විචාරක සහ පාඨක දෙපාර්ශ්වයට ම මඟහැර යා නො හැකි ය. සියලු ම ශුද්ධ වූ වස්තූන් කෙළෙසුන පශ්චාද් නූතනවාදයේ පවා ප්‍රේමය උදාරත්වයකින්, විශ්වාසයකින් ඉහළට ඔසවා තැබීමට කවියා වෙහෙසෙ යි. විශ්වය හා සබැඳි සෞන්දර්ය සංකල්ප අතර රාත්‍රිය, සඳ, බටනලාව වැනි ප්‍රේමයට අදාළ පැරණි සංකල්ප ඔස්සේ ප්‍රේමයේ නව ඉසව් පිළිබඳ ඔහු නිර්මාණය කරන කාව්‍ය සිනමා සිත්තමක් සේ විචිත්‍රවත් වන බව ප්‍රතීත ය.

''සඳ කුමරු

වයනවිට වස්දඬුව

රැයේ මැදියම

සාගරය විලස ම

උමතු වූ රැල්ල

නැඟෙයි

ඇගේ මුළු

සිරුරේ ම''

අතිශය පුළුල් සංකීර්ණ අදහස් ධ්වනිත කරමින් ප්‍රේමය ගැන කීමට කවියා ගත් තවත් උත්සාහයක් මෙසේ ය.

"ජීවිතය පවා
පරදුවට තබා
මී වදයට ම
අත තබා
රැගෙන ආවෙමි
මී පැණි
නුඹේ සිත
තුටුවන නිසා
ඒ වෙනුවට
සිදුවෙයි නුඹට
දෙන්න මට
නුඹ ගතේ
ඇති විසිර
ලවණ මුසුවූ
ඒ මිහිර"

ඉහත පද්‍ය පෙළ සම්ප්‍රදායික හින්දි කවියට නවතාවයක් එක් කරන නිදසුනකි. කාව්‍යයේ යථාර්ථය ඉස්මතු කිරීමට සහ ප්‍රේමයේ ප්‍රතීයමාන අර්ථයට නවමු දැක්මක් එක් කිරීමට එය සමත් වෙයි. සුධීර්ගේ කාව්‍යකරණය පිළිබඳ විචාරයෙහි යෙදෙන නූතන විචාරකයින්ගේ අදහස වන්නේ කවියාගේ පරිකල්පනයේ පරිසමාප්ති

ය යි. පූර්වයෙන් සඳහන් කළ නිදර්ශන සියල්ල සලකා බලන කල ක්‍රම විරෝධි කවියකු වන සුධීර් සක්සේනා සෞන්දර්ය කැටි කොට කෝමලත්වයකින් 'ප්‍රේමය' සිත්තම් කිරීම විස්මය උපදවන සුලු ය.

සුධීර්ගේ කවිය සතු සියලු සාධනීය ප්‍රවේශයන් පරදවමින් සංකල්ප රූප මැවීමේ ප්‍රබලත්වය ප්‍රමුඛතාවය ගන්නා බව විචාරකයෝ අතර සාකච්ඡාවට ලක් වී ඇත. කවියන් විසින් භාවිතා කිරීම දුර්ලභ කොටගත් කදිම රූපක ස්වභාවයක් සුධීර්ගේ සෑම කවියකට ම ගොනු වී ඇත. ඔහුගේ සෑම කාව්‍ය නිර්මාණයකින් ම ඔහු සතු විශ්මයානුකූල භාෂා හරඹය කැපී පෙනෙන්නේ ය. ''අන් කිසිම ආකාරයකින් දැනවිය නො හැකි අරුත් ප්‍රකාශ කිරීම පිණිස වචන යොදනු ලබන විශේෂ ආකාරය කවිය'' යන සී. ජේ. ලුවිස්ගේ අදහස සුධීර්ගේ කවිය විසින් නැවත නැවතත් අර්ථවත් කරයි.

මහාචාර්ය ජිනදාස දනන්සූරිය මහතා සිය සාහිත්‍ය නිර්මාණ සහ යථාර්ථ ඥානයඃ ශ්‍රී ලාංකේය සහ ඉන්දියානු නිදර්ශන කිහිපයක් යන ශාස්ත්‍රීය ලිපියෙහි මෙසේ සඳහන් කරයි.

"කලාකරුවා මිනිසුන් ව පැහැදිලිව දකිතැයි ද ඔවුන් ඇඳ සිටින ඇඳුම්වල රැළි මෙන් ම වේදනාවෙන් හා ශෝකයෙන් පරපීඩිත ඔවුන්ගේ ඇහි බැමිවල රැළි පවා ඔහුට ගණනය කළ හැකි යැයි ද ව්‍රොන්ස්කි පවසයි. ඔහු දැනටමත් ඔබට වඩා මැනවින් මිනිසුන් දැනහැඳින ගෙන ඇත. ඔහු ඔබේ පියා සහෝදරයා යහළුවා සහෝදරිය ළබැඳි පෙම්වතිය ඔබට වඩා හොඳින් හැඳින ගෙන ඇත. ඔවුන් කරන කියන දෑ ඔහු දනියි. ඔවුන්ට තර්ජනාංගුලිය ඔසවන-හාත්පස සිසාරා බ්‍රමණය වන සිදුවීම් ද එමගින් ඔවුන් එකට බැඳ තබනු ලබන ආකාරය ද ඔහු දකියි." සුධීර් සක්සේනාගේ කාව්‍ය නිර්මාණ විමර්ශනය කිරීමේ දී මිනිසුන්ගේ මෙකී සකලවිධ සිතිවිලි, චිත්තවේග සහ හැසිරීම් පිළිබඳ ඥානය ඔහු සාර්ථකව ග්‍රහණය කරගෙන ඇති ආකාරය හඳුනාගත හැකි ය.

සුධීර් සක්සේනාගේ කාව්‍යවල නිරූපිත මානව අත්දැකීම්වල යථාර්ථය මගින් සහෘදයන් ව සිය ග්‍රහණයට හසුකර ගනු ලැබීම මවිතයට කරුණක් නො වන බව ඔහුගේ කවි කියා පායි. හින්දි සාහිත්‍ය විචාරක උමා ශංකර්සිංහ් පර්මාර් දක්වන අන්දමට සුධීර්

සක්සේනාගේ කාව්‍ය සිත් කාවදින විශද රූපයෙන් දැනුම සපයයි. ඒවා සමාජය සහ මිනිස් ඉතිහාසය වෙත ආලෝකධාරා විහිදුවයි. පශ්චාද් නූතනවාදී සමාජයේ අන්තර්ගත ප්‍රතිවිරෝධතාවල සංකීර්ණත්වය පිළිබඳ ව ඥානයක් සහෘදයනට ප්‍රදානය කර දෙයි.

කල්පනාලෝකවාදය සාහිත්‍ය කලා හා මාක්ස්වාදය කෘතියෙහි කර්තෘවරු මෙසේ සඳහන් කරයි. "...කාව්‍යයක් හෝ නවකතාවක් රචනා කිරීමේ දී චිත්‍රයක් ඇඳීමේ දී හෝ සංගීතයක් නිර්මාණය කිරීමේ දී කලාකරුවා තමා යථා ලෝකයේ දී මුහුණ දුන් බලවේග අතර සබඳතා සංකල්ප රූප මඟින් වින්දකයාට සංස්පර්ෂ කරවීමට හා වින්දනය කරවීමට වෙර දරයි. ඕනෑම නිර්ව්‍යාජ කලා කෘතියක් සමඟ සම්පර්ක වීමේ දී සහෘදයා මෙතෙක් තම හද රැඳි හැඟීම් සංක්‍රමණයක් සිදු වූ බව පසක් කරන්නේ එහෙයිනි. කලාකරුවා තම සහෘදයා තුළ මෙම පෙරළිය සඳහා සැබැවින් ම වෙර දරන්නේත් එම පෙරළිය ඇති කිරීමට තරම් ප්‍රබල සංකල්ප රූප නිපදවන්නේත් ඒවා හැඩගැස් වීමට උචිත අංග අතීත සම්ප්‍රදායෙන් තම අණසක යටතට කැඳවා ගන්නේත් තමා ද කොටසක් වන ලෝකය තමාට රිසි සේ හසුරුවා ගැනීමට දරන ප්‍රයත්නයක උත්තේජනය යටතේ ය. මාක්ස් වරෙක සඳහන් කළ පරිදි කලාකරුවා ආත්මය සඳහා ආත්මයක් ද නිපදවෙන කලා කෘතිය පෙරළා රසික ආත්මයේ ම ස්වභාවය වෙනස් කරයි. සියලු සත් නිර්මාණයන්ගේ මහිමයත් උදාරත්වයත් පවත්නේ මෙතැන ය."

දශක හතක සම්පූර්ණ ජීවන යාත්‍රාවකට උරුමකම් කියන භාරත දේශයේ නූතන කවියා, සිතුවිලිවලින්, දැක්මෙන් තවමත් තාරුණ්‍යයෙන් පිරිපුන් ය. නව පරම්පරාවක් පිළිබඳ දැඩි විශ්වාසයක් තබාගෙන සිටින සුධීර් සක්සේනා ආධුනික හින්දි කවියන් කාව්‍යකරණයට පෙළඹ වූ හේතුකාරකයක් බව හඳුනාගත හැකි ය. 'සූර්යාටත් ළඟා විය නො හැකි තැනට ළංවූවෝ කවියෝය' යන හින්දි කියමන යථාර්ථයක් බවට පත්කරන සුධීර් සක්සේනා භාරතීය සංස්කෘතිය විශ්වයටත් විශ්ව සංස්කෘතිය භාරතයටත් හුවමාරු කරන පාලමක් සේ ස්වකීය කාව්‍ය භාවිතා කරන අයුරු හඳුනා ගත හැකි ය. රසවින්දනයේ දී සහ විචාරයේ දී උසස් ම කවිය සොයා ගැනීම පහසු නැත. එහෙත් කවිය පිළිබඳ ඇසු පිරූ තැන් ඇති විචාරකයාට ද

අන්තර්ඥානයකින් කවිය අවබෝධ කර ගන්නා පාඨකයාට ද සුධීර්ගේ කවිය සොයා ගැනීම අපහසු නැත.

සුධීර්ගේ කාව්‍ය නිර්මාණ රසවිඳින පාඨකයා කවියාගේ කාව්‍යවල පදපේළි කිහිපයක් මතකයේ රඳවාගෙන සිටින්නේ ජීවන ගමනේ බොහෝ අවස්ථාවල දී භාවිත කරන්නට ය.

"...ලැබේවා

තොල්වලට ගීත

දෙපාවලට මාවත

දෑත්වලට ආයුධ

එවිට අවැසි නැත

දෙවියන්ගෙන් කිසිවක්

යදින්නට නැවත..."

මෙසේ මිනිස් ජීවිතය සහ ඒ හා බැඳුණු ඉතිහාසයේ විවිධ සංසිද්ධි තේමා කරගත් සුධීර් සක්සේනාගේ කවිය භාරතීය සංස්කෘතියේත් විශ්ව සංස්කෘතියේත් ප්‍රතිබිම්බයකි. සුධීර් සක්සේනාගේ වාග් ශක්තිය බෙහවින් ම ප්‍රබල ය. එබැවින් ඔහුගේ කාව්‍ය පරිශීලනය කරන පිටස්තරයන් පවා තමන්ගේ බවට පත් කර ගැනීමේ ශක්‍යතාවක් ඔහුගේ කාව්‍ය තුළ ශක්තියක් ලෙස පැහැදිල ව පෙනෙන්නට ඇත. එය අතිශය සමීප ලෙස හෘදය සමඟ සිදු කරන සංවාදයකි. අවසිහියට පත්වීම වෙනුවට කාන්තිමත් ප්‍රභාවකින් පාඨකයා බැබළවීමට එම කවිවලට හැකි ය. හින්දි සාහිත්‍යයේ 'නයී කවිතා' නම් සාහිත්‍ය ධාරාව විමර්ශනයට ළක්කිරීමේ දී එහි දෘෂ්ටිමය පාර්ශවය හැසිරවීමට සුධීර් සක්සේනා විසින් සිදුකෙරෙන මැදිහත් වීම මෙම අධ්‍යයනය ඔස්සේ විදහා පාන්නකි.

සමාලෝචනය

මෙම අධ්‍යයනයේ දී නව කවි ව්‍යාපාරයෙහි සුවිශේෂ ලක්ෂණ සහ එහි විකාශනය පිළිබඳ පැහැදිලි කරගත හැකි සුධීර් සක්සේනාගේ කවිය පිළිබඳ සාකච්ඡා කෙරුණ අතර තෝරාගත් කාව්‍ය නිර්මාණ ආශ්‍රයෙන් එකී ලක්ෂණ එම කාව්‍ය නිර්මාණවල ප්‍රායෝගිකව භාවිත වී ඇති ආකාරය පිළිබඳවත් විමසා බැලිණි. සුධීර් සක්සේනාගේ කවිය විදග්ධ විචාරවාදයකට මඟ විවර කරන අතර එය හින්දි සාහිත්‍යයේ නව කවිය පෝෂණය කිරීමට ප්‍රායෝගිකත්වයෙන් යුක්ත වන ආකාරය සුධීර්ගේ කාව්‍යාශ්‍රයෙන් පැහැදිලි කර ගත හැකි වේ.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අහමද්, මාජිද්. (2016). **111 කවිතාඒ: සුධීර් සක්සේනා**. දිල්ලී: ලෝකමිත්‍ර ප්‍රකාශන්.

ඍතුපර්ණ, සුරේෂ් මුක්තිබෝධ්. (2004). **කී කාව්‍ය සෘෂ්ටි**. නයී දිල්ලී: රාධා කෘෂ්ණන් ප්‍රකාශන්.

පර්මාර්, උමාශංකර්සිංහ්. (2014). **සුධීර් සක්සේනා කී ලම්බී කවිතාඒ**. දිල්ලී: ලෝකමිත්‍ර ප්‍රකාශන්.

පාංඩේය, යශස්විනී. (2012). කවිතා නේ ජිසේ චුනා. දිල්ලී: ලෝකමිත්‍ර ප්‍රකාශන්.

බාලසූරිය, කීර්ති සහ ගම්ලත්, සුචරිත. (1986). **කල්පනාලෝකවාදය සාහිත්‍ය කලා හා මාක්ස්වාදය**. කොළඹ: එස් ගොඩගේ සහෝදරයෝ.

මුක්තිබෝධ්, ගජානන්ද් මාධව්. (2014). **නයී කවිතා කා ආත්ම සංඝර්ෂ්**. නයී දිල්ලී: රාජකමල් ප්‍රකාශන්.

සක්සේනා, සුධීර්. (1998). **රාත් ජබ් චන්ද්‍රමා බජාතා හෑ බාසුරී**. නයී දිල්ලී: ලෝකමිත්‍ර ප්‍රකාශන්.

සක්සේනා, සුධීර්. (2000). **සමර්කන්ද් මේ බාබර්**. නයී දිල්ලී: ලෝකමිත්‍ර ප්‍රකාශන්.

සක්සේනා, සුධීර්. (2004). **කිරච් කිරච් යකීන්**. නයී දිල්ලී: ලෝකමිත්‍ර ප්‍රකාශන්.

සක්සේනා, සුධීර්. (2006). **ධූසර් මේ බිලාසාපුර්**. නයී දිල්ලී: ලෝකමිත්‍ර ප්‍රකාශන්.

සක්සේනා, සුධීර්. (2008). **ඊශ්වර් හා... නහී... තෝ**. නයී දිල්ලී: ලෝකමිත්‍ර ප්‍රකාශන්.

සක්සේනා, සුධීර්. (2008). **කිතාබේ දීවාර් නහී හෝතී**. නයී දිල්ලී: ලෝකමිත්‍ර ප්‍රකාශන්.

සක්සේනා, සුධීර්. (2012). **කුඡ් භී නහී අන්තිම්**. නයී දිල්ලී: ලෝකමිත්‍ර ප්‍රකාශන්.

සිංහ්, විජයමෝහන්. (2006). **බීස්වී ශතාබ්දී කා හින්දී සාහිත්‍ය**. නයී දිල්ලී: රාජකමල් ප්‍රකාශන්.

ශ්‍යාම්සුන්දර්දාස්. (2009). **සාහිත්‍යාලෝචන්**. ඉලහාබාද්ඃ ප්‍රකාශන් පරිවාර්.

සිංහ්, විජයමෝහන්. (2006). **බීස්වී ශතාබ්දී කා හින්දී සාහිත්‍ය**. නයී දිල්ලීඃ රාජකමල් ප්‍රකාශන්.

ශ්‍යාම්සුන්දර්දාස්. (2009). **සාහිත්‍යාලෝචන්**. ඉලහාබාද්ඃ ප්‍රකාශන් පරිවාර්.

(2014). **A Special Volume of One Asia Seminar Series**. Department of Sinhala: University of Kelaniya.